www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *8-10 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness**
**Chapters 8-10**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බ්‍රෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද* `Objectivism or Marxism` *(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිලිතුරු වසයෙනි.*

*අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ඡේද දෙසැම්බර් 11 දා ද 4 සිට 7 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 13 දා ද පල විය. 8 සිට 10 දක්වා පරිච්ඡේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.*

### 8. ලෝසවෙඅ සහ 'දේශපාලන එලිදරව්'

සමාජවාදී විඥානය සඳහා අරගලය පිලිබඳ මගේ සංකල්පනය ගැන ඔබ විසින් කෙරෙන විවේචනයට දැන් අපි ආපසු හැරෙමු.

*කල යුත්තේ කුමක් ද?* පිලිබඳ මගේ දේශනය සඳහන් කරමින් (එනමුත් එයින් උපුටා නො දක්වමින්) ඔබ කියා සිටින්නේ "නෝර්ත් තමාගේ වර්ජකවාදයට යුක්ති ප්‍රතිපාදනය සඳහා ලෙනින්ව කපා, ලෙනින් නමා හැඩගස්සා ගැනීමට, ආර්ථිකවාදීන් පාන් සහ බටර් ප්‍රශ්නවලට යොමුවීමට ප්‍රතිවිරුද්ධව පන්ති විඥානයේ වර්ධනය පිලිබඳ තම ප්‍රවිශ්ටය පිහිටුවාලීම සඳහා යොදා ගත් 'දේශපාලන එලිදරව් කිරීම්' යන වාක්‍යාංශය අවධාරනය කරන" බවයි. ඔබට අනුව "නෝර්ත් මෙම වාක්‍යාංශය පැන බදාගන්නේ *ලෝසවෙඅ* හි පුවත් කලාවේදී පැවැත්ම එම පදය විසින් යුක්ති සහගත කෙරෙනු ඇතැ යි පෙනී යන හෙයිනි, එහෙත් ලෙනින් මෙම වාක්‍යාංශය පන්ති විඥානය තරම් සංකීර්න වූ ප්‍රශ්නයක් විසඳුලීම සඳහා කිසියම් වර්ගයක කෝකටත් තෛලයක් ලෙස යොදා ගන්නේ යයි සිතා ගැනීම තේරුමක් නැති කතාවකි."

ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි, නරක ම විවාද විධිය වන්නේ පාඨකයන් මුග්ධ යයි සිතා සිටින්නා වූ හෝ ඔවුන්ගේ මුග්ධත්වය ආමන්ත්‍රනය කරන්නා වූ විවාද ක්‍රමය ය. හරියට ම ඔබ යොදා ගන්නේ අන්න ඒ විධි ක්‍රමය යි. මා දැනට ම සටහන් කර ඇති පරිදි ඔබ කවර විටෙකත් මගේ වාර්තාවලින් නිවැරදිව හෝ නිවැරදි සන්දර්භයෙහි තබා හෝ උපුටා දක්වන්නේ නැත. එසේ වන්නේ ඔබේ අරමුන උගැන්වීම නො ව නො මග යැවීම හා

රැවටීම ය. *කලයුත්තේ කුමක් ද* යන ලෙනින්ගේ කෘතිය පිලිබඳ මගේ විග්‍රහය ට ඔබ එල්ල කරන ප්‍රහාරය තුල ඔබ මගේ දේශනයෙන් හෝ මා සඳහන් කල ලෙනින්ගේ ජනක කෘතියෙන් කිසි විටෙකත් උපුටා දක්වන්නේ නැත. "දේශපාලන එලිදරව් කිරීම්" යනු *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වැඩ කටයුතු සඳහා සාවද්‍ය අධිකාරයක් සම්පාදනය කිරීමට මා "අවධාරනය කල" (එනම් අතිශයෝක්තියට නැගූ) වාක්‍යාංශයක් නො වේ. මෙමෙ වචන ඇත්තට ම සඳහන් වන්නේ ලෙනින්ගේ කෘතියේ දෙවන පරිච්ඡේදයේ තුන්වන කොටසේ මාතෘකාවේ කොටසක් ලෙස ය. (" දේශපාලන එලිදරව් සහ විප්ලවවාදී ක්‍රියාකාරිත්වයට පුහුනු කිරීම") එම පරිච්ඡේදයේ මාතෘකාව වන්නේ, " මහ ජනතාවගේ ස්වයං සිද්ධභාවය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විඥානය" යන්න යි. ලෙනින් යොදා ගත් පරිදි "දේශපාලන එලිදරව් කිරීම්" යනු හුදු වාක්‍යාංශයක් නො වේ; එය වනාහී ඔහුගේ සමාජවාදී විඥානය පිලිබඳ න්‍යායේ කේන්ද්‍රිය සංකල්පයකි. මෙම සංකල්පය ආර්ථිකවාදයට එරෙහි අරගලය තුල දී අවුරුදු ගනනාවක් තිස්සේ වර්ධනය කරන ලදී. ආර්ථිකවාදය වනාහී රුසියාව තුල බර්න්ස්ටීනියානු සංශෝධනවාදය අත් කර ගත් සුවිශේෂ රූපය යි.

ලෙනින් සහ ප්ලෙඛානොව් මූලික හා අන් සියල්ල පරයා යන අවධාරනයක් දුන් කම්කරු පන්තිය දේශපාලනිකව උගන්වා ගැනීම කේන්ද්‍රස්ථ කර ගත් විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී යොමුව විස්ථාපනය කර ඒ වෙනුවට සාම්ප්‍රදායික සටන්කාමී වෘත්තීය සමිති පිලිවෙත් මත ආර්ථික ප්‍රශ්න ගැන උද්ඝෝෂනය කිරීම යොදා ගැනීමට ආර්ථිකවාදී ප්‍රවනතාවය යත්න දැරුවේ ය. ලෙනින් සිය කෘතියේ දෙවන පරිච්ඡේදයේ තුන් වන කොටසේ මෙසේ ලිවී යෑ:

> "දේශපාලන උද්ඝෝෂනය අවශ්‍ය ලෙස ව්‍යාප්ත කිරීම පිනිස, ඉටු කල යුතු මූලික කොන්දේසියකි, *[සර්වග්‍රාහී]* දේශපාලන හෙලිදරව් කිරීම් සංවිධානය කිරීම. එවැනි හෙලිදරව් කිරීම්වලින් හැර, *වෙනත් කිසිම මාර්ගයකින්* පොදු ජනතාවට දේශපාලන විඥානය හා විප්ලවවාදී ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පුහුනුවක් දිය හැකි නොවේ. මෙම ස්වරූපයේ ක්‍රියාකාරිත්වය, සමස්ත ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේම ඉතාමත් වැදගත් කාර්යයක් වන්නේ එහෙයිනි. දේශපාලන නිදහස තිබුනත්, හෙලිදරව් කිරීම් සඳහා අවශ්‍යතාවය එයින් මැකී යන්නේ නැත. එයින් සිදු වන්නේ එම හෙලිදරව් කිරීම්වල එල්ලයේ ක්ෂේත්‍රය පමනක් තරමක් දුරට වෙනස් වීම ය. [ලෙනින්, *තෝරාගත් කෘති වෙලුම් දොලහ*, වෙලුම 1, (මොස්කව්, 1979), පි.186-187]

ලෙනින් තව දුරටත් මෙසේ ද කී යෑ:

> "දුෂ්කර තත්වයට පත් වන පන්තිය කුමක් ද යන්න නොතකා, දුෂ්ටත්වය, පීඩනය, හිංසනය හා අක්‍රමිකතාවය පිලිබඳ සෑම අවස්ථාවකදීම, ක්‍රියාත්මක වීමට කම්කරුවන් පුහුනු කරන්නේ නම් මිස, එමෙන්ම, වෙනත් කිසිම දෘෂ්ටි කෝනයකින් නොව, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටි කෝනයෙන් ක්‍රියාත්මක වීමට ඔවුන් පුහුනු කරන්නේ නම් මිස, කම්කරු පන්ති විඥානයට අව්‍යාජ දේශපාලන විඥානයක් බවට පත් විය නොහැක. අන් සෑම සමාජ පන්තියක ම ජීවිතය කෙරෙහි දක්නට ලැබෙන, බුද්ධිමය, ආචාර-විචාරමය හා දේශපාලනමය වූ සියලු දේත් සහිතව ද, නියත හා විශේෂයෙන්ම කාලීන දේශපාලන කරුනු තුලින් හා සිදුවීම් තුලින් ද, එම පන්ති ගැන නිරීක්ෂනය කිරීමට කම්කරුවන් උගත හොත් මිස, වැඩ කරන ජනතාවගේ විඥානය, නියම පන්ති විඥානයක් බවට පත් වන්නේ නැත." [එම - පි.187. අවධාරනය මුල් කෘතියෙනි.]

එම ඡේදය ම සමාප්ත කිරීමේ දී ලෙනින් මෙසේ පවස යි,

"පොදු ජනතාව දේශපාලන ක්‍රියාකාරිත්වයෙහි පුහුනු කිරීම සඳහා, මෙම අංග සම්පූර්න දේශපාලන හෙලිදරව් කිරීම අත්‍යවශ්‍ය මූලික කොන්දේසියකි." [එම - පි. 188. අවධාරනය මුල් කෘතියේ.]

ජාත්‍යන්තර කමිටුවේ වැඩ හෙලා දැකීමට උත්සාහ කරමින් ඔබ ද්වේෂ සහගතව "ලෝසවෙඅ පුවත් කලාවේදී පැවැත්ම" ගැන සඳහන් කරයි; එපමනක් නො ව දේශපාලන එලිදරව් කිරීම් හුදෙක් "පුවත් කලාවේදය"[11] සමග සමාන කිරීමට උත්සාහ කරයි. මෙය වනාහී දේශපාලන පසුගාමිත්වයට ද බුද්ධි-විරෝධයට ද අත වැනීමට වැඩි දෙයක් නො වේ. සමාජවාදී හා දේශපාලන වසයෙන් ප්‍රගතිශීලී වූ කම්කරුවන්ගේ බුද්ධිමතුන් හා තරුන ජනයාගෙන් යුත් ලෝක ශ්‍රාවකයකට විශ්ලේෂනයක් හා ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරන ප්‍රවෘත්ති මාධ්‍යයක් නිර්මානය කිරීම ගැන ඔබ ජාත්‍යන්තර කමිටුවට පහර දෙන්නෙහි ය. මෙවන් අත්‍යවශ්‍ය ක්‍රියාකාරිත්වයකට පහර දීමට ඉදිරිපත් වනවා ඇත්තේ මාක්ස්වාදය සහ සමාජවාදී අදහස් සඳහා අරගලයට විරුද්ධ වන්නවුන් පමනි. දේශපාලන විශ්ලේෂනයේ වැඩ කටයුතු ප්‍රතිගාමී ධනේශ්වර පුවත් පත් වලට, නැත හොත් ඩිමොක්‍රැටික් පක්ෂයේ සේලන් හා ද නේෂන් (මේවා තමන්ගේ වෙබ් අඩවි වර්ධනය කර ගැනීමට මෑත දී සැලකිය යුතු සම්පත් යට කර තිබේ.) වැනි ප්‍රකාශනවල සිටින වාම-ලිබරල් උපදේශකයන්ට එසේත් නැති නම් සඳහට ම නො මග ගොස් සිටින සිය දහස් ගනන් රැඩිකල් කන්ඩායම්වලට අතහැර දැමීමට ඔබ වඩා කැමැති ද?

කෙසේ වෙතත් න්‍යායික හා දේශපාලන ප්‍රකාශනයක් පල කිරීම සඳහා තමන්ගේ ශක්තීන් සංකේන්ද්‍රනය කිරීම අනුචිත යයි මාක්ස්වාදීන් සලකන්නට පටන් ගත්තේ කවදා සිට ද? ඔබ මැනවින් දන්නා පරිදි, දේශපාලන පුවත් පතක්, ඉස්ක්‍රා ව, රුසියානු සමාජවාදී ව්‍යාපාරයේ ඉතිහාසයෙහි සැතපුම් කනුවක් සලකුනු කලේ යෑ ලෙනින් තම දේශපාලන ජීවිතයේ මුල් කාලයේ අවුරුදු ගනනක් ගත කලේ මෙම කර්තව්‍යයට වේ. 1901 සිය *පටන් ගත යුත්තේ කොතැනින් ද* යන ලිපියේ ලියූ පරිදි:

> අප අදහස් කරන පරිදි අපගේ කටයුතුවල ආරම්භක ස්ථානය විය යුත්තේ, අප අපේක්ෂා කරන සංවිධානය නිර්මානය කිරීම පිනිස ගත යුතු ප්‍රථම පියවර, එසේ නැත හොත්, එම සංවිධානය ස්ථිරසාර ලෙස සංවර්ධනය කිරීමට, ගැඹුරු කිරීමට හා ව්‍යාප්ත කිරීමට හේතුවන පරිදි අනුගමන කල හැකි වන ප්‍රධාන නූල්පට විය යුත්තේ, සමස්ත රුසියානු දේශපාලන ප්‍රවෘත්ති පත්‍රයක් පටන් ගැනීම ය. අපට අන් සියල්ලටම වඩා අවශ්‍ය වී ඇත්තේ ප්‍රවෘත්ති පත්‍රයකි. එය නොමැති කල ප්‍රතිපත්තියෙන් සසංගත වූ ක්‍රමානුකූල සර්වපාර්ශවීය ප්‍රචාරය හා උද්ඝෝෂනය කිරීම අපට හැකි නොවේ. සාමාන්‍ය වසයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන හා ස්ථිර කර්තව්‍යයද, ජනගහනයේ පුලුල්තම ස්තරයන් දේශපාලනය ගැන හා සමාජවාදය පිලිබඳ ප්‍රශ්න ගැන උනන්දුවෙන් ප්‍රබෝධමත්ව සිටින මෙම අවස්ථාවේ විශේෂ කර්තව්‍යයද වන්නේ එම ප්‍රචාරය හා උද්ඝෝෂනය කරගෙන යාමය. ... දේශපාලන පත්‍රයක් නොමැතිව වර්තමාන යුරෝපයේ දේශපාලන ව්‍යාපාරයක් යන නමට සුදුසු වන ව්‍යාපාරයක් පැවතිය හැකි නොවේ. එවැනි ප්‍රවෘත්ති පත්‍රයක් නොමැතිව අපට අපගේ කර්තව්‍යය ඉටු කල හැකි වන්නේ නැත. -දේශපාලන අප්‍රසාදයේ හා විරෝධය පෑමේ මූලිකාංගයන් සියල්ලම සංකේන්ද්‍රනය කිරීමේ සහ එමගින් නිර්ධන පන්තියේ

විප්ලවීය ව්‍යාපාරය පන ගැන්වීමේ අපගේ කර්තව්‍යය ඉටු කල හැකි වන්නේ නැත. අපි මුල් පියවර ගෙන සිටිමු. අපි "ආර්ථික" - එනම් ෆැක්ටරි හෙලිදරව් කිරීම් සඳහා වූ - අනුරාගයක් කම්කරු පන්තිය තුල පුබුදුවා ඇත්තෙමු. දැන් අපි ඊලඟ පියවර ගත යුත්තෙමු. එනම්, ජනගහනයේ සෑම කොටසක්ම, නැතහොත්, දේශපාලන විඥානය ඇති සෑම කොටසක්ම තුල, දේශපාලන හෙලිදරව් කිරීම් සඳහා අනුරාගයක් පුබුදුවා ලිය යුත්තෙමු." (ලෙනින්, පටන් ගත යුත්තේ කොතැනින්ද; 8-9 පි.)

තමන් විසින් "දේශපාලන එලිදරව් කිරීම්" පහ කොට දැමීම න්‍යායික ප්‍රතිඋත්තරයකට බෙහෙවින් ම ගෝචර යයි හඟිමින් ඔබ හදිසියේ ම ඔබගේ ගියර් මාරු කර මෙසේ තහවුරු කරන්නෙහි ය, "1902 න් මොබ කාලය වෙනසට පත්ව ඇතැ යි සටහන් කර ගැනීම ලෙනින්ට කරන අවමානයක් නො වේ. අද දින සුලු-ධනේශ්වර රැඩිකල්ලු, ඔවුන්ගේ ආර්ථිකවාදී පූර්වප්‍රාප්තිකයන් මෙන් නො ව, හුදෙක් පාන් සහ බටර් ප්‍රශ්නවලින් පමනක් නො ව කම්කරු පන්තිය සම්බන්ධ කුමන දෙයකින් හෝ බොහෝ ඈත්ව සිටිති."

මෙහි දී ඔබ පුහු සුලභ වාක්‍යාංශයක්, දේශපාලන වසයෙන් අදාල ප්‍රශ්නයට කිසිදු වැදගත්කමක් නැති ප්‍රකාශයක්, සහ පැහැදිලිව ම අසත්‍ය ප්‍රකාශයක් යන මේ සියල්ල එක් තනි වාක්‍යයකට රුවා ඇත. "කාලය වෙනස්ව ඇතැ" යි ඔබ කියන්නෙහි ය. ඔව්, අප ජීවත් වන්නේ 1902 නො ව 2006 දී යයි අපි සියලු දෙනා ම දන්නෙමු. එහෙත් කම්කරු පන්තියේ දේශපාලන විඥානයේ වර්ධනය ගැන ලෙනින් කල න්‍යාය-පාදිත සප්‍රපත්තික අවධාරනයේ අදාල බව හීන වී ඇත්තේ වත්මන් තත්වයේ සිදුව ඇති කුමන වෙනසක් නිසා ද? දේශපාලන එලිදරව් කිරීම් පිලිබඳ සංකල්පය පැන නැංගේ කම්කරු පන්තියේ පන්ති විඥානයේ වර්ධනය පිලිබඳව ධනේශ්වර සමාජයේ ස්වභාවය තුල ම මුල්බැස ගෙන පවතින්නා වූ ගැටලුව පිලිබඳ විශ්ලේෂනයක් තුලිනි. එම විශ්ලේෂනයේ අදාලත්වය හීන විය හැකිවන්නේ සමාජවාදී පන්ති විඥානයේ වර්ධනය සඳහා මාක්ස්වාදයෙන් ආස්වාදිත දේශපාලන එලිදරව් කිරීම් තවදුරටත් අවශ්‍ය නො වන්නා වූ ආකාරයකට ධනේශ්වර නිෂ්පාදන විධියේ සහ ධනේශ්වර සමාජයේ පොදු සංවිධානයේ මූලික ව්‍යුහාත්මක පරිවර්තනයන් සිදු වී පවතින්නේ නම් පමනකි. එහෙත් තත්වය මෙසේ පරිවර්තනයව පවතින්නේ නම් අපට ලෙනින් ඉදිරිපත් කල වඩාත් පොදු සංකල්පයක්, එනම් සමාජවාදී විඥානයට ස්වයං සිද්ධව වර්ධනය විය නො හැකි යයි ද, එය කම්කරු පන්තිය තුලට පිටතින් ඇතුලු කල යුතු යයි ද යන්න සංශෝධනය කිරීමට සිදු වේ.

1902 දී පැවැති තත්වයන් ද අද පවත්නා දේශපාලන එලිදරව් කිරීම්වල වැදගත්කම හීන කිරීමට තුඩු දෙන තත්වයන් ද අතර තීරක වෙනසක් ලෙස ඔබ කියා සිටින්නේ දැන් සුලු-ධනේශ්වර රැඩිකලුන් පැරනි ආර්ථිකවාදීන්ට වඩා මුලුමනින් ම වෙනස් බව ය; ඊට හේතුව වසයෙන් ඔබ ඉදිරිපත් කරන්නේ "මොවුන් පාන්-සහ-බටර් ප්‍රශ්නවලින් බොහෝ ඈත්ව සිටින බවත් කම්කරු පන්තිය සමග මොන ම ගනුදෙනුවක් වත් ඔවුන්ට නැති බවත් ය."

මෙහි ලා ප්‍රථමයෙන් ම පැහැදිලි කල යුතු වන්නේ, විඥානය පිලිබඳ ලෙනින්ගේ න්‍යායේ අදාල බව රඳ පවත්නේ සුලු ධනේශ්වර රැඩිකලුන් යෙදී සිටින හෝ යෙදී නො සිටින ක්‍රියාකාරකම් උඩ නො ව, ධනේශ්වර සමාජයේ වෛෂයික ව්‍යුහය හා සමාජ සම්බන්ධතාවන් මත ය යන්න යි. දෙවනුව ඔබේ අභ්‍යර්ථනය සංසිද්ධියක් ලෙස පරම වසයෙන් ම අසත්‍ය ය. වර්තමාන වෘත්තීය සමිති නිලධරය 1960, 1970 සහ 1980 ගනන්වල රැඩිකල් දේශපාලන සංවිධානවලින් පලා ගිය මධ්‍යම පන්තික සරනාගතයන්ගෙන් *පිරී ඉතිරී* ගොසිනි. එස්ඊඅයියූ සංවිධානයේ සභාපති ඇන්ඩෘ ස්ටර්න්, ලේබර් නිලධරයේ ඉහල මන්ඩලවල තම ජීවන චර්යාව ගොඩනගාගත් හිටපු රැඩිකලුන් දුසිම් ගනනකින් එක් අයෙකි. ඩීඩබ්ලිව්යූ ලෝකල් 100 පාලනය කරන නිව් ඩිරෙක්ෂන් ව්‍යාපාරය විවිධ රැඩිකල් ප්‍රවනතාවන්ගේ නිර්මානයකි. සුලු ධනේශ්වර

රැඩිකල් සොලිඩැරිටි ප්‍රවනතාවය විවිධ වෘත්තීය සමිතිවල නිලධරය හා ගැඹුරින් ඒකාග්‍රිතව පවතී. අප විසින් මෙහි දී පෙන්නුම් කල හැකි සිද්ධියක් නම් ඔබට මතක යයි මා විශ්වාස කරන නැන්සි ෆීල්ඩ්ස් වුල්ෆර්ත් මෑතක දී ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානයේ ජාත්‍යන්තර විධායක මන්ඩලයට තෝරා පත් කර ගනු ලැබ තිබීමය."[12] සුලු ධනේශ්වර රැඩිකලුන්ට "කම්කරු පන්තිය සමග කිරීමට කිසියම් දෙයක් ඇත්තේ නැත" යන කියාපෑම ගැන කීවොත් සත්‍යය නම් එහි සාකල්‍ය ප්‍රතිවිරුද්ධයයි. මොවුන් වෘත්තීය සමිති අවස්ථාවාදයේ අතිශයින් ම ප්‍රතිගාමී ස්වරූපයේ උම්මත්තක ප්‍රකාශකයන් බවට පත්ව සිටිති. ඔවුන්ගේ වැඩ කටයුතු කම්කරු පන්තිය තුල සමාජවාදී දේශපාලන ක්‍රියාකාරකම්වල වර්ධනයට නිර්දය ලෙස ප්‍රතිවිරුද්ධව යොමු කරනු ලැබ පවතී.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ට එරෙහි ඔබේ මීලඟ තර්කය විකාරයකි. දේශපාලන එලිදරව් කිරීම් " අන්තර් ජාලයේ රැඩිකල් වෙබ් අඩවි රොත්තක සහ එන්න එන්න ම ජනප්‍රියත්වයෙන් වැඩිවෙමින් පවත්නා වාර්තා චිත්‍රපටකරනය තුල "දේශපාලන එලිදරව් කිරීම් දැක ගත හැකිය" යි ඔබ කියන්නෙහි ය. "මයිකල් මුවර්, දේශපාලන එලිදරව්" නිර්මානය කිරීම මගින් සුප්‍රසිද්ධව ඇත, එහෙත් මෙය තව මත් පන්ති විඥානය බොහෝ දුර ය. ෆැරන්හයිට් 9/11 වැනි චිත්‍රපටයක් ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ට ආධාරය ලබා ගැනීම සඳහා යොදා ගැනීම තුලින් එම පරතරය වේදනාකර ලෙස පැහැදිලි වී ඇත."

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ට එරෙහි බරපතල තර්කයක් ලෙස මෙය ගනු ලැබෙතැ යි ඔබ අපේක්ෂා

කරනවා ද? ඔබේ සැකකටයුතු සංවාක්‍යයෙන් උකහා ගත යුත්තේ කුමන නිගමනයක් ද? 1. ලෝසවෙඅ දේශපාලන එළිදරව් කිරීම් නිර්මානය කරයි; 2. මයිකල් මුවර් ද දේශපාලන එළිදරව් කිරීම් නිර්මානය කරයි; එබැවින් 3. ලෝසවෙඅ දේශපාලනය ද මයිකල් මුවර්ගේ දේශපාලනය ද එක ම ය? නැත හොත් සමහර විට 1. සුලුධනේශ්වර රැඩිකල්වාදියෝ දේශපාලන එළිදරව් කිරීම් නිර්මානය කරති; 2. ලෝසවෙඅ ලේඛකයෝ ද දේශපාලන එළිදරව් කිරීම් නිර්මානය කරති; එහෙයින් 3. ලෝසවෙඅ ලේඛකයෝ සුලුධනේශ්වර රැඩිකල්වාදියෝ ය?

ඔබ ඔබගේ ලියවිල්ලේ මෙම කොටස සමාප්ත කරන්නේ පහත සඳහන් පුදුම එලවන ප්‍රකාශයෙනි: "ලෙනින් අද ජීවත්ව සිටියා නම්, ඔහු කියන්නට හොඳට ම ඉඩ ඇත්තේ "දේශපාලන එළිදරව් කිරීම්" හොඳ හා යහපත් නමුත්, මාක්ස්වාදීන් විසින් අද සැපිරිය යුතු ඉතා ම වැදගත් අවශ්‍යතාවය නම් ප්‍රවාහන කම්කරුවන් වැන්නවුන් අරගල තුල ඇති දැවැන්ත නායකත්වයේ අර්බුදය සපුරා ලීම ය." ලෙනින් වෘත්තීය සමිති ක්‍රියාකාරකයෙක් හැටියට දක්වන මෙය සත්‍ය වෙතොත්, මාක්ස් අද ජීවත්ව සිටියා නම් ඩොයිෂ් බැංකුවේ කොටස් සමපේක්ෂන අංශය දුවවනවා ඇත. එංගල්ස්, සමහර විට, ඩෙයිම්ලර් බෙන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වනු ඇත. එහෙත් එවිට මේ පුනරාවතාරයන් මාක්ස්, එංගල්ස් හෝ ලෙනින් නො වනු ඇත.

## 9. 2004 මැතිවරනය

ඔබේ ඊලඟ ඡේදයේ දී ඔබ කියා සිටින්නේ මගේ ඊනියා වෛෂයිකවාදය සහ විඥානය පිලිබඳ යාන්ත්‍රික සංකල්පය නිසා මා 2004 මැතිවරන ප්‍රතිඵල පැහැදිලි කිරීමට අසමත් වූ බව ය; ඡන්ද ප්‍රතිඵලය "පැහැදිලි කල නො හැක්කක්" ලෙස තැකූ බව ය. ඔබ එක් සම්පූර්න වාක්‍යයක් උපුටා දක්වන එකම අවස්ථාව මෙය යි. ඒ 2004 නොවැම්බර් මාසයේ මෑත දී සම්පූර්න කරනු ලැබූ ඡන්ද විමසීම පිලිබඳව මා කල දේශනයකිනි. මම මෙහි දී ඉතා ම දිළිඳු බවට පත් ප්‍රාන්ත රාජ්‍යවල බහුතරය බුෂ්ට පක්ෂපාතව ඡන්ද යෙදීම ගැන මෙසේ සඳහන් කලෙමි. "ඡන්ද දායකයන් තමන්ගේ භෞතික අවශ්‍යතාවලට වඩා බොහෝ ඉහලින් තබන 'සාරධර්ම' හේතු කොට ගෙන බුෂ්ට ආධාර කලේ යයි නිගමනය කිරීම වනාහි සමාජ-ආර්ථික විශ්ලේෂනය වෙනුවට ගුඪවාදය යොදාගැනීමකි." ඔබ (පිටුව සඳහන් නොකොට) උද්ධෘතය මෙතැනින් අවසන් කරන්නෙහි ය. ඉක්බිති මෙසේ නිවේදනය කරන්නෙහි ය: "එහෙත් මෙය ඡන්ද විමසීමේ දී සිදු වූ දෙය කිසි සේත් වටහා ගත නොහැකි තත්වයකට අපව පත් කරයි, මන්දයත්, එහි දී පැහැදිලිව ම කිසියම් වර්ගයක සාරධර්මයන් භූමිකාවක් ඉටු කල හෙයිනි."

ඔබ මගෙන් උපුටා දක්වූ එම වාක්‍යය මා කියූ සියල්ල වන්නේ නම් එය සත්තකින්ම බුෂ් ඉතා දිළිඳු ප්‍රාන්ත රාජ්‍යවල බහුතරය අත්පත් කර ගත්තේ මන් ද යන්න පිලිබඳ අර්ථ කථනයක් හැටියට කිසි සේත් නො සෑහෙනු ඇති බව සත්‍ය ය. එහෙත්, සත්‍ය කාරනය නම්, එම වාක්‍යය ඔබ අතහැර දමන විස්තෘත විශ්ලේෂනයක ආරම්භය පමනක් බව ය. මම පහත සඳහන් දෙය (ඉහත වාක්‍යයට වහාම ඉක්බිත්තේ) ඉදිරිපත් කර ඇත්තෙමි.

නිශ්චිත වසයෙන් ඉන් අදහස් කරනු ලබන්නේ කුමකට දැයි නො පැහැදිලි වූ "සාරධර්ම" පිලිබඳ වියුක්ත සමර්පන කම්කරුවන් රිපබ්ලිකානු පක්ෂයේ ද එහි පරිවාර ආගමික තොරොම්බල්කාරයින්ගේ ද සදාචාරවාදී බොරුකාරයන්ගේ ද බලපෑමට හසුව ඇත්තේ මන් ද යන්න පැහැදිලි කිරීමට ඉටු කරනු ඇත්තේ අල්පමාත්‍රයකි. වඩාත් ඒත්තු ගන්වනසුලු පෙහෙලියක් වන්නේ කලෙක සටන්කාමී වෘත්තීය සංගම්වාදයේ මුරකපොලු බවට පත් ව තිබුනු ප්‍රාන්තවල පැරනි කම්කරු ව්‍යාපාරය තථ්‍යසමව බිඳ වැටීම විසින් දසලක්ෂ ගනන් කම්කරුවන් තම සමාජ ප්‍රශ්නවලට මුහුන දීම සඳහා මොන ම ක්‍රමයක් වත් නැතිව, පන්තියක් හැටියට තමන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීමේ මොන ම විධියක් වත් නැති තත්වයකට ඇද වැටී ඇති බව ය. අපි ඇමරිකානු කම්කරු පන්තියේ එක් කොටසකගේ සමාජ අත්දැකීම සලකා බලමු. විසිවන ශතවර්ෂයෙන් වැඩි කොටසක් තුල එක්සත් පතල් කම්කරුවන්ගේ සංගමයේ (යූඑම්ඩබ්ලිව්ඒ) සංවිධානය වූ ගල් අඟුරු කම්කරුවන්ගේ අරගල බටහිර වර්ජිනියාව, කෙන්ටකී පමනක් නො ව වර්ජිනියාවේ ද ටෙනසීහි ද ආර්කන්සාස්හි ද ඔහයියෝ සහ ඉන්ඩියානාවේ ද සැලකිය යුතු ප්‍රදේශ හරහා ඇවිල ගියේ ය. පතල් කම්කරුවෝ ඇමරිකානු කම්කරු පන්තිය තුල වඩාත් ම පන්ති විඥාත කම්කරුවන් යයි තර්ක කල හැකි විය. ජෝන් එල් ලුවිස් සමහර විට කියන්නට ඉඩ තිබුනු පරිදි - ඔව්හු "අගේ ඇති අපක්ෂපාතී බවකින්" යෝධ ගල්අඟුරු සංගතවලට එරෙහිව සටන් වැද ගනන් නැති අවස්ථාවල ධවල මන්දිරය (ජනාධිපති බලය) අභියෝගයට ලක් කලහ. එහෙත් 1980 දී පතල් කම්කරුවෝ විනාශකාරී පරාජයන් මාලාවකට මුහුන දුන්නාහ. ප්‍රමුඛව ම ප්‍රතිගාමී වෘත්තීය සමිති නිලධරය වගකිව යුතු වූ මෙම පරාජයන් විසින් යූඑම්ඩබ්ලිව්ඒ සංවිධානය නොවැදගත් හිස් කටුවක් බවට පරිවර්තනය කැරිනි; දහස් ගනන් ගල් අඟුරු පතල් රැකියා අතුගා දමන ලදහ.

පෙර දින සටන්කාමී කම්කරුවෝ රැකියාවලින් තොරවී, පරම්පරා ගනනාවක අරගල පෝෂනය කල ගැඹුරින් මුල් දිවූ සමාජ සම්බන්ධතාවලින් කැපී වෙන්වී, තමන්ව පාවා දී අතහැර ගිය වෘත්තීය සමිතියක් කෙරෙ විරසකවී සෑම විට ම අලුත් ගැනුම්කරුවන් සොයා ඉව අල්ලමින් සිටි හොඳට පදම් වූ ධර්ම ප්‍රචාරක ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පහසුවෙන් පත් කර ගනු ලැබූහ. සංවිහිත කම්කරු ව්‍යාපාරයක වාතාවරනයෙන් මුලුමනින් ම පිටස්තරවී, පන්ති

අරගලයේ සම්ප්‍රදායයන් පිලිබඳව වැටහීමෙන් මුලුමනින් ම වියෝවී, නැත හොත් ඉතා හීනවී හැදී වැඩුනු එවන් කම්කරුවන්ගේ දරුවනට පන්ති විඥානය වර්ධනය කර ගැනීමට පවත්නා බාධා බෙහෙවි. මෙම *ලෝකය තුල ම මෙම ජීවිත කාලය තුල ම* - වඩා යහපත් සහ වඩා මානුෂික සමාජයක් ගොඩනගා ගත හැකි ය යන්න තබා, සම කාලීන සමාජය කෙරේ විවේචනශීලී ආකල්පයක් වර්ධනය කර ගැනීම සඳහා වුව ආධාරකාරී වූ තොරතුරු හා අභිනිවේෂයන් ඔවුන්ට ලබා ගත හැක්කේ කොතනින් ද? සහතිකෙන් ම පවත්නා දේශපාලන පක්ෂ හෝ පොදු මාධ්‍යයන් නමැති  නරාවලෙන් නම් නො වේ.

මෙහි අර්ථය වන්නේ සාමාන්‍ය ඇමරිකානු කම්කරුවා ජන මාධ්‍ය සහ රිපබ්ලිකානු දේශපාලන යන්ත්‍ර විසින් තමන් නිරන්තර ව පාත්‍ර කරනු ලබන ප්‍රචාරය නිකම්ම ගිලගන්නවා ය යන්න නො වේ. ගව් ගනනකින් හෝ එසේ නම් නැත. දේවල් විය යුතු අකාරයට නො පවතින බව වටහා ගැනීමට ඔව්හු ජීවිතය ගැන ඇති තරම් දැන සිටිති. කම්කරුවා " සාරධර්ම" ගැන කතා කරන විට ඔහුට එහි ඇති තේරුම එන්රොන් සමාගමේ කෙනත් ලේ හෝ ජනාධිපති ජෝර්ජ් බුෂ්ට පවත්නා අර්ථයට වඩා ඉතා වෙනස් ය.

2004 ජනාධිපතිවරනයේ දී "සාරධර්ම" දැරූ අර්ථභාරය ප්‍රශ්නයට භාජන කරන්නා වූ වාර්තා ගනනාවක් දැනට ම ඉස්මතු වී පවතී. දැන් පෙනී යන පරිදි මුල දී කරන ලද පශ්චාත්-මැතිවරන අභ්‍යර්ථනයන් විසින් පදනම් කර ගැනුනු විමර්ශන දත්තයන් එක්කෝ නොමගයවන සුලු හෝ සාවද්‍ය ලෙස අර්ථකථනය කැරුනු ඒවා යයි පෙන්නුම් කරන වාර්තා ගනනාවක් ඉදිරිපත් වී තිබේ. මා විශ්වාස කරන්නේ ද එය එසේ යයි කියා ය. එහෙත් මෙහි දී තහවුරු කල යුතු වූ සැබැවින් ම වැදගත් කරුන නම් "සාරධර්මයන්" පිලිබඳ ප්‍රශ්නය ඉස්මතුව ඇත්තේ ප්‍රධාන පක්ෂ දෙකින් එකක් වත් තුලින් පලල් ඇමරිකානු වැඩ කරන ජනතාවගේ සමාජ, ආර්ථික, දේශපාලන අවශ්‍යතාවන් ප්‍රකාශිත නුවූ රික්තයක් තුල ය යන්නයි. ඩිමොක්‍රැටික්, රිපබ්ලිකන් දෙපක්ෂ ද ජනමාධ්‍ය ද යන මේ සියල්ල ඇමරිකානු ධනවාදයේ උත්කෘෂ්ටභාවය පිලිබඳ උන්මාදනීය ගීතිකා ගයන්නා වූ මහා වෘන්දයක විවිධ කොටස් බවට පත්ව සිටිති.

මෙය වනාහි පුද්ගලයන් මාරු කිරීම මගින් හෝ වඩා හොඳ අපේක්ෂකයන් තෝරා ගැනීමක් මගින් ජයගත හැකි තාවකාලික දුබලකමක් නො වේ. එය ඇමරිකානු ධනවාදයේ විකාශනයේ ප්‍රතිවිපාකයකි; සාපේක්ෂව සුලු දෙනෙකු අත අත්‍යසාමාන්‍ය ලෙස ධනය සංකේන්ද්‍රනය වීමේ ද, සමාජ අසමානතාවේ ද ආන්තික මට්ටම සහ කලෙක ධනපතියන් හා කම්කරුවන් අතර පන්ති අරගලයේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියා කරමින් සමාජ ප්‍රතිසංස්කරනවාදයට සැලකිය යුතු ඡන්දාශයක් සකසා දුන්නා වූ සාම්ප්‍රදායික "මධ්‍යම පන්තියේ" වේගවත් පරිහානිය අවසාන වසයෙන් සාම්ප්‍රදායික ධනේශ්වර පාලන ආකෘතීන් පවත්වාගෙන යාමට බැරෑරුම්ව කැප වී ගත් සැලකිය යුතු කන්ඩායමක් පාලක ප්‍රභූව තුල නැති වී යාම ද යන මේ සියල්ලේ ප්‍රතිවිපාකය ය." [*The Crisis of American Democracy: The Presidential Elections of 2000 and 2004*, ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදයඃ 2000 සහ 2004 ජනාධිපතිවරනය (ඩිට්‍රොයිට්, 2004), පි. 104-105, මුල් කෘතියේ අවධාරනය).]

ජනාධිපතිවරනයේ ප්‍රතිඵලය "පෙහෙලි කල නොහැකි ය" යි මා කවර ලෙසක වත් නො සැලකූ බව හොඳට ම පැහැදිලි ය. ඔබ සරලව ම තෝරා ගත්තේ මගේ පෙහෙලිය උපුටා නො දැක්වීමට ය. එහෙත් (ඔබේ) මුසාකරනය එතනින් හමාර නො වේ. ඉක්බිති ඔබ මෙසේ ප්‍රකාශ කරන්නෙහි ය. මවිසින් " යාන්ත්‍රික භෞතිකවාදියෙකු හැටියට" "විඥානය, එය සැකසුවා වූ යථාර්ථය නිරවද්‍යව වටහා ගනු ඇත; එනම්, වෛෂයික කොන්දේසි එම කොන්දේසි පිලිබඳ නිවැරදි විඥානයකට තමන්ව ම සෘජුව ම පරිවර්තනය කර ගන්නා බව උපකල්පනය කර ගනු ලබන බව" ය. සත්තකින් ම එවන් සංකල්පනයක් සාවද්‍ය වේ. කෙසේ වෙතත්, ඔබ සියලු දෙනා දන්නා පරිදි, මා කවර විටෙකවත් එවැන්නක් කියා නැත. සත්‍ය කරුන නම් පසු ගිය ගිම්හානයේ මා ඉදිරිපත් කල තුන් වන දේශනයේ සැලකිය යුතු කොටසක් කම්කරු පන්තිය තුල ස්වයංසිද්ධව පැන නගින විඥානය සමාජවාදී විඥානය නො වන්නේ මන් ද යන්න පිලිබඳ පෙහෙලියකට මා යෙදූ බවයි. විවාදය කරා විමසීමේ දී ඔබගේ දේශපාලන විරුද්ධවාදීන් දරන්නා වූ හා සැබැවින් ම ප්‍රකාශ කල ආස්ථානයන්ගේ ප්‍රතිවිරුද්ධය වන ආස්ථානයන් ඔවුන්ට පැවැරීමට සූදානම් වන ඔබ දක්වා ඇති අප්‍රතිපත්තික ප්‍රවිෂ්ටයේ ප්‍රතිවිපාකයක් ලෙස, මට යලිත් මගේ දේශනයෙන් දීර්ඝ උද්ධෘතයක් ඉදිරිපත් කිරීමට සිදුව ඇත.

''තමන්ගේ රැකියාව එහි අංශුමාත්‍ර අවයවයක් වන්නා වූ දැවැන්ත අන්තර් සම්බන්ධිත භූගෝලීය ආර්ථික ජාලයක් පිලිබඳ ව රැකියාවන්ට යන ජනයා කොතෙක් දුරට දැන සිටිත් ද? තමන්ගේ රැකියාව හෝ තමා සේවය කරන සමාගම හෝ සමග, නූතන ජාත්‍යන්තර නිෂ්පාදනයේත් භාන්ඩ හා සේවා හුවමාරුවේත්, අතිශය සංකීර්න ක්‍රියා දාමයන්ට ඇති සම්බන්ධතාව පිලිබඳ ව වඩාත් ම බුද්ධිමත් කම්කරුවාට වුව ඇත්තේ අතිශයින් ම නොපැහැදිලි අවබෝධයකැයි උපකල්පනය කිරීම අසාධාරන නො වේ. එමෙන් ම, අන්තර් ජාතික ධනේශ්වර මූල්‍ය අභිරහස් ද, වටිනාකම් ආරක්ෂා කිරීමේ භූගෝලීය අරමුදල්වල කාර්ය භාරය ද, ඩොලර් බිලියන දස ගුනයෙන් වටනා මූල්‍ය සම්පත් දිනපතා අන්තර් ජාතික දේශ සීමා හරහා එහා මෙහා වීමේ රහසිගත හා බොහෝ විට (ක්ෂේත්‍රයේ විශේෂඥයනට පවා) විනිවිද නො යා හැකි ආකාරයන් ද පිලිබඳ වටහා ගැනීමේ හැකියාවක් තනි කම්කරුවෙකුට නැත. නූතන ධනේශ්වර නිෂ්පාදනයේ, වානිජ්‍යයේ හා මූල්‍යයේ යථාර්ථයන් කොතරම් සංකීර්න ද යත්, සංගතයන්හි ප්‍රමුඛයෝ ද දේශපාලන නායකයෝ ද ඒ පිලිබඳ ප්‍රධාන අධ්‍යාපන ආයතනයන්හි විශ්ලේෂන හා උපදෙස් මත

රැඳී සිටිති. තමන් හමුවේ ඇති දත්තවල අර්ථය කුමක් ද යන්න පිලිබඳ ව ඔවුන් විවිධ මත දරන අවස්ථාවන් ඇත්තේ ස්වල්පයක් නො වේ.

එහෙත් පන්ති විඥ්ඥානය පිලිබඳ ගැටලුව වූ කලි, නූතන ආර්ථික ජීවිතයේ සංකීර්න ප්‍රපංචය හදාරා ග්‍රහනය කොට ගැනීමේ ද එහි ස්වාමිත්වයට පත් වීමෙහි ලා ඇත්තා වූ ද නිසැක දුෂ්කරතාවන්ට වඩා ඔබ්බට විහිද යන්නකි. වඩාත් මූලික හා සාරභූත තලයක දී, තනි කම්කරුවෙකු හා ඔහුගේ හාම්පුතා ද අතර සමාජ සම්බන්ධයේ නිශ්චිත ස්වභාවය සමස්ත කම්කරු පන්තිය හා ධනේශ්වරය අතර සම්බන්ධය පසෙක තිබිය ද, සංවේදන සංජානනයේ හා සමීප අත්දැකීම්වල මට්ටමෙන් ග්‍රහනය නොකෙරෙන්නේ හා නො කල හැකි ය.

තමන් සූරා කෑමට භාජන වන බැව් ඒත්තු ගත් කම්කරුවෙකුට වුව, තමාගේ ම කටුක පුද්ගලික අත්දැකීම්වල පදනම මත, එම සූරා කෑමට යටින් පවත්නා සමාජ-ආර්ථික යන්ත්‍රනය සංජානනය නො කල හැකි ය. තව ද, සූරා කෑම පිලිබඳ සංකල්පය යනු පහසුවෙන් වටහා ගත හැක්කක් නො වේ. තමන්ට ප්‍රමානවත් ගෙවීමක් නො කෙරේ ය යන ඉවෙන් කෙලින් ම එම සූරා කෑම පිලිබඳ සංකල්පය ව්‍යුත්පන්න කර ගැනීම ගැන කියනුම කවරේ ද? රැකියාවක් සඳහා ඉල්ලුම් කරමින් අයැදුම් පතක් පුරවන කම්කරුවා තම ශ්‍රම ශක්තිය, විකිනීම සඳහා ඉදිරිපත් කරන බැව් සංජානනය නො කරයි; නැත හොත්, එම ශ්‍රම ශක්තියට පමනක් ආවේනික ගුනය වන්නේ එය මිල දී ගැනීම සඳහා ගෙවන මිලට (වැටුපට) වඩා වැඩි වටිනාකමක් උපදවීමට ඊට ඇති හැකියාව බැව් වටහා නො ගනියි. ලාභය ව්‍යුත්පන්න කෙරෙන්නේ ශ්‍රම ශක්තිය මිලට ගැනීමේ පිරිවැය හා එම ශ්‍රමය විසින් නිර්මානය කෙරෙන වටිනාකම ද අතර වෙනසින් බව නො හඟියි.

එමෙන් ම කම්කරුවෙක් යම් නිශ්චිත මුදලක් ගෙවා වෙලඳ භාන්ඩයක් මිලට ගන්නා විට, එම ගනුදෙනුව යනු සාරභූත වසයෙන් දේවල් අතර සම්බන්ධයක් (කබායක් හෝ වෙනත් වෙලඳ භාන්ඩයක්, යම් නිශ්චිත මුදලකට මිලට ගැනීම) නො ව මිනිසුන් අතර සම්බන්ධයකැයි යන අවබෝධය ද ඔහුට නැත. මුදලේ ස්වභාවය, රූපික වටිනාකමෙහි ප්‍රකාශනය ලෙස ඓතිහාසික ව එය පැන නැංගේ කෙසේ ද සහ නිෂ්පාදනයත් වෙලඳ භාන්ඩ හුවමාරුවත් විශ්වමය වූ සමාජයක යටින් දිවෙන ධනපති සමාජයේ සමාජ සබඳතා සඟවා ආවරනය කිරීමට එය ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න අවබෝධ කොට ගැනීමට ඔහු පැහැදිලි ව ම අසමත් ය.

මා මේ දැන් සාකච්ඡා කල දෑ, මාක්ස්ගේ වඩාත් ම වැදගත් කෘතිය වූ ප්‍රාග්ධනයේ (කැපිටාල්) න්‍යායික-ඥානවිභාගයික පදනම ලෙස සැලකිය හැකි දැය පිලිබඳ පොදු හැඳින්වීමක් ලෙස සැලකිය හැකි ය. එහි ප්‍රථම වෙලුමෙහි, අතිශය වැදගත් පලමු පරිච්ඡේදයෙහි, අවසාන කොටසෙහි දී මාක්ස්, වෙලඳ භාන්ඩ උද්දීපනය පිලිබඳ සිය න්‍යාය හඳුන්වා දෙයි. එහි දී, ධනපති සමාජය තුල සමාජ සම්බන්ධතා ගූඪකරනය වීමේ වෛෂයික මූලාශ්‍රය එනම්, මෙම සුවිශේෂී අර්ථ ක්‍රමය තුල මිනිසුන් අතර වන සමාජ සබඳතා දේවල් අතර සම්බන්ධතා ලෙස අත්‍යවශ්‍යයෙන් ම පෙනී යන්නේ කුමක් නිසා ද යන්න, පැහැදිලි කරයි. දෙන ලද ඕනෑ ම වෙලඳ භාන්ඩයක වටිනාකම වූ කලි එය නිෂ්පාදනය කිරීමෙහි දී වැය වූ මිනිස් ශ්‍රමයේ ඓක්‍යයෙහි ස්ඵටිකීකෘත ප්‍රකාශනය බැව්, සංවේදනයේ සංජානනය හා ආසන්න අත්දැකීම්වල පදනම මත කම්කරුවන්ට දැක ගත නොහැකිවාක් මෙන් ම පෙනී යන්නේ ද නැත. වටිනාකම් ආකෘතියේ වෛෂයික සාරය සොයා ගැනීම, විද්‍යාත්මක චින්තනයේ ඓතිහාසික සන්ධිස්ථානයක් නියෝජනය කලේ ය. මෙම සොයා ගැනීම නො වන්නට, පන්ති අරගලයේ වෛෂයික සමාජ-ආර්ථික පදනම් හෝ ඒවායේ විප්ලවවාදී ඇඟවීම් හෝ වටහා ගත නො හැකි වනු ඇත.

තමන් ජීවත් වන පද්ධතියෙහි සමාජ ප්‍රතිවිපාකයන්ට කෙතෙක් අකමැති වුව ද, කම්කරුවා සිටින්නේ, එම පද්ධතියෙහි සම්භවය හෝ එහි අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් හෝ එහි පැවැත්මේ ඓතිහාසික සීමාසහිත බව, තම ආසන්න අත්දැකීම්වල පදනම මත ග්‍රහනය කර ගත හැකි තත්වයක නො වේ. ධනේශ්වර මාදිලියේ නිෂ්පාදනයේ ප්‍රතිවිරෝධතා ද, ප්‍රාග්ධනය හා වැටුප් ශ්‍රමය අතර පවත්නා සූරා කෑමේ සම්බන්ධතාව ද, පන්ති අරගලයේ නො වැලැක්විය හැකි ස්වභාවය හා එහි විප්ලවවාදී ප්‍රතිවිපාක ද පිලිබඳ අවබෝධය විකසිත වූයේ සැබෑ විද්‍යාත්මක වැඩ කොටසක පදනම මත ය. එම වැඩ කොටස සමග මාක්ස්ගේ නාමය සදාකාලික ව බැඳී පවතිනු ඇත. මෙම විද්‍යාව තුලින් ලබා ගත් දැනුම සහ එම දැනුම අත් කර ගැනීමේ හා විස්තාරනය කිරීමෙහි ලා උපයෝගී වූ විශ්ලේෂන විධික්‍රමය කම්කරු පන්තියට හඳුන්වා දිය යුතු ය. විප්ලවවාදී පක්ෂයේ කර්තව්‍යය වන්නේ එය යි.'' (සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005 තෙවන දේශනය: *බොල්ශෙවික්වාදයේ සම්භවය හා ''කල යුත්තේ කුමක් ද? ''*, 6 වන කොටස, පි.2-3)

ගිම්හාන දේශනයන්ගෙන් සෘජුව උපුටා දැක් වී ඇති මෙම ඡේදයෝ ඔබ මට පවරා සිටින ආස්ථානයට පරම වසයෙන් ම ප්‍රති විරුද්ධ වූ ආස්ථානයක් ඉදිරිපත් කරති.

## 10. මාක්ස්වාදය සහ බුද්ධි ප්‍රබෝධය

විවාදයක් කරා සප්‍රතිපත්තික ප්‍රවිෂ්ටයක් ගැනීමට නම් ප්‍රතිවාදියාගේ තර්ක නිවැරදිව ඉදිරිපත් කිරීම අවශ්‍ය ය. ඔබට මෙය කර ගත නො හැකි වීම - එනම් නො මග යැවීමට හා වැරදිව ඉදිරිපත් කිරීමට ද එහි ප්‍රතිඵල වශයෙන් බොරු කීමට ද අවශ්‍ය යයි ඔබට හැඟී යාම ම - බරපතල හා සිත් සසල කරන දේශපාලන ගම්‍යයන් දරා සිටියි. ට්‍රොට්ස්කි පෙන්වා දුන් පරිදි, දේශපාලන ජීවිතයේ දී බොරුව එක් මූලික කාර්යයක් ඉෂ්ට කරයි: දේශපාලන ආස්ථානයක දුර්වලකම් සහ පරස්පරයන් වසන් කරන එය සමාජමය ආසක්තයන් වසං කිරීමට යොදා ගනු ලැබේ. ඔබ පිලිබඳව ගන්නා කල්හි වංචනික විධික්‍රම ගලා එන්නේ - එතරම් මැ නො දැනුවත් ව

නො ව - මාක්ස්වාදයේ න්‍යායික සහ දේශපාලන පදනම් ප්‍රතික්ෂේප කර සිටින ඔබ ප්‍රසිද්ධියේ මාක්ස්වාදියෙකු ලෙස පෙනී සිටීමට දරන්නා වූ උත්සාහයෙනි. ජාත්‍යන්තර කමිටුව සමග ඔබට පවත්නා මතභේදයෝ හුදු වෙන් වෙන් ක්‍රියාමාර්ගික කරුනු පිලිබඳව නො වෙති; සමාජවාදය සඳහා අරගලය පදනම් වී ඇත්තා වූ දාර්ශනික ලෝක දෘෂ්ටිය පිලිබඳ බෙහෙවින් ම අතිමූලික ප්‍රශ්නයන් පිලිබඳව වෙති.

ඔබගේ විප්ලවවාදී ගරුත්වය මෙම "අවමානයට" විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට හුන්'සුනෙන් නැගී සිටීමට පෙර, මට මෙය පෙන්නුම් කිරීමට අවසරයක් දෙන්නඃ ඔබගේ ලියවිල්ල මාක්ස්වාදයේ ලෝක-ඓතිහාසික දෘෂ්ටියට මුලුමනින් ම සතුරු වූ ඡේදයන් සහිත ය. ඔබේ ප්‍රකාශනයේ එන වෙසෙසින් ම ආවේෂනීය උදාහරනයක් නම් - මා "පශ්චාත්-නූතනවාදය පිලිබඳව කරන විවේචනය බුද්ධි ප්‍රබෝධනය අවිවේචනාත්මකව ආරක්ෂා කිරීමට අවසර ලබා ගැනීමට යොදා ගෙන ඇති බව ය."

මගේ දේශනයේ ඔබ සඳහන් කරන එහෙත් උපුටා නො දක්වන ඡේදය එන්නේ "පශ්චාත් නූතනවාදයට එරෙහිව ඓතිහාසික විඥානය" නම් කොටසේ ය. මම මෙසේ කීවෙමිඃ

> මානව විමුක්තිය උදෙසා අරගලය තුල දී ඓතිහාසික අත්දැකීම පිලිබඳ ඥානයට හා න්‍යායික ස්වීකරනයට ඒ සා කේන්ද්‍රීය හා තීරනාත්මක භූමිකාවක් පවරා දෙන්නා වූ අප පිලිගන්නා ඉතිහාසය පිලිබඳ සංකල්පය වනාහී පවත්නා සියලු ධනේශ්වර චින්තන ප්‍රවනතාවන්ට සමහන් කල නොහෙන අන්දමින් සතුරු ය. ධනේශ්වර සමාජයේ දේශපාලනික, ආර්ථික හා සමාජීය ජරපත් වීම, එහි බුද්ධිමය පරිහානිය විසින් මෙහෙයවනු නොලබන්නේ නම් එය විසින් පිලිබිඹු කරනු ලැබේ. ට්‍රොට්ස්කි වරක් සඳහන් කල පරිදි, දේශපාලන ප්‍රතිගාමීත්වය පිලිබඳ කාලපරිච්ඡේදයක දී අවිද්‍යාව සිය දත් විලිස්සයි.
>
> ධනේශ්වර චින්තනයේ වඩාත් චතුර හා නරුම ශාස්ත්‍රාලීය නියෝජිතයින් වන පශ්චාත් නූතනවාදීන් විසින් අද දවසේ හොබවනු ලබන අවිද්‍යාවේ, නිශ්චිත හා විශේෂිත රූපාකාරය වන්නේ, ඉතිහාසය පිලිබඳ *නොතැකීම හා ඒ කෙරේ දක්වන පිලිකුල යි.* ඉතිහාසයේ වලංගුතාව ද සමාජීය චින්තනය පිලිබඳ සියලු සැබෑ ප්‍රගතිශීලී ප්‍රවනතාවන් විසින් එයට පවරා දුන් කේන්ද්‍රීය භූමිකාව ද පශ්චාත් නූතනවාදීන් විසින් අත්‍යන්තයෙන් ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ගේ න්‍යායික සංකල්පවල තවත් සාරභූත අංගයක් සමග අවියෝජනීය ව බැඳී තිබේ. එනම් දාර්ශනික විමර්ශනයෙහි දී, කේන්ද්‍රීය තබා අර්ථභාරී අරමුන වසයෙන් වත් වෛෂයික සත්‍යය ප්‍රතික්ෂේප කිරීම හා පැහැදිලිව බැහැර කිරීම යි.
>
> එසේ නම්, පශ්චාත් නූතනවාදය යනු කුමක් ද? පැහැදිලි කිරීමක් වසයෙන්, මේ ප්‍රවනතාවේ ප්‍රමුඛතම විද්වත් ආරක්ෂකයකු වන මහාචාර්ය කීත් ජෙන්කිංස් විසින් රචිත ඡේදයක් උපුටා දැක්වීමට, මට අවසර දෙන්නඃ
>
> "අද අපි පශ්චාත් නූතනත්වය පිලිබඳ සාමාන්‍ය තත්වය තුල ජීවත් වන්නෙමු. මේ පිලිබඳ අපට තෝරාගැනීමක් නොමැත. පශ්චාත් නූතනත්වය යනු අපට එකඟ වනු හෝ නො වනුහැකි හෝ තෝරාගත හැකි 'දෘෂ්ටිවාදයක්' වත් ආස්ථානයක් වත් නො වන හෙයිනි. පශ්චාත් නූතනත්වය යනු නිශ්චිත ව ම අපගේ තත්වය යි, එය අපේ ඉරනම යි. මේ තත්වය විවාදාත්මක ලෙස උදා කරනු ලැබ තිබෙන්නේ නූතනත්වය වසයෙන් අප හඳුන්වන සමාජීය ජීවිතය පිලිබඳ අත්හදාබැලීමේ අසාර්ථකත්වය විසිනි - මේ අසාර්ථකත්වය විසි වන සියවස මත දුහුවිලි තැන්පත් වෙද්දී දැන් පැහැදිලි ව ම හඳුනා ගැනීමට පුළුවන. එහි ම කොන්දේසිවලින් මනිනු ලැබූ කල්හි, දහ අට වන සියවස අවට කාලයේ පටන් යුරෝපයේදී තර්කය, විද්‍යාව හා තාක්ෂනය යොදාගැනීම ඔස්සේ, සමාජ සැකැස්ම තුල පුද්ගලික හා සමාජීය යහ පැවැත්මේ මට්ටමක් උදා කිරීමට, සිය පුරවැසියන්ගේ/විෂයන්ගේ වර්ධනය වන්නා වූ විපුලිත විමුක්තිය උදෙසා ව්‍යවස්ථා සම්පාදනය මගින් දරන ලද ප්‍රයත්නයෙහි, අපට ඔවුන් "මානව හිමිකම් පිලිබඳ ප්‍රජාවන්" බවට පත් වීමට දැරූහ යි ගුනාංගීකරනය කල හැකි ප්‍රයත්නයෙහි, සාමාන්‍ය අසාර්ථකත්වයකි එය.
>
> මේ නූතනය අත්හදා බලනු පිනිස උපකාරී වූ කිසිදු 'සැබෑ' පදනමක් දැන් නො පවතී - කිසි කලෙක පැවතියේ ද නැත.'
>
> පශ්චාත් නූතනවාදීන්ගේ ම භාෂාව පරිහරනය කලහොත්, මේ ඡේදය 'විනිර්මිත' කිරීමට මට අවසර දෙන්න. දහ අට වැනි සියවස දක්වා පසුපසට දිවෙන අවුරුදු දෙසීයක් තිස්සේ, විද්‍යාව හා බුද්ධි ප්‍රබෝධයේ දර්ශනය විසින් ආවේශ ගැන්වුනු, මානව පරිපූර්නත්වය සාක්ෂාත් කිරීමේ හැකියාව ගැන විශ්වාසය තැබූ සහ ඉතිහාසයේ වෛෂයික නීතීන් වෙත යොමු වූ විද්‍යාත්මක ආලෝචනා හැටියට ඔවුන් විශ්වාස කල දෙයෙහි පදනම මත, සමාජය විප්ලවවාදී ව පරිවර්තනය කිරීමට මෙහෙයවීගත් මිනිස්සු වාසය කලෝ ය.
>
> පුද්ගලයාගේ ආත්මීය විඥ්ඥානයෙන් ස්වාධීන ව පවත්නා සමාජ ආර්ථික බලවේග මගින් නිර්නය කෙරුනු, එහෙත් මිනිසාට සොයාගත හැකි, අවබෝධ කරගත හැකි හා මානව ප්‍රගතියේ අවශ්‍යතා උදෙසා ක්‍රියාවට නැගිය හැකි නීති පරිපාලිත ක්‍රියාවලියක් ලෙස, එවැනි මිනිස්සු, ඉතිහාසය (History - කැපිටල් එච් අකුර සහිතව) විශ්වාස කලෝ ය.
>
> එහෙත් මේ සකලවිධ සංකල්ප ලාමක මායාවන් බව පෙනීගොස් ඇතැයි පශ්චාත් නූතනවාදීහු ප්‍රකාශ කර සිටිත්. අපි දැන් වඩා හොඳින් දන්නෙමුඃ (History - කැපිටල් එච් අකුර සහිත ව) ඉතිහාසය කියා දෙයක් නැත. හුදු වෛෂයික ක්‍රියාවලියක් හැටියට අවබෝධ කරගැනුනු (history - කුඩා එච් අකුර සහිත) ඉතිහාසයක් පවා නැත. ඇත්තේ, කර්තව්‍යය කවරක් හෝ වේවා, එක් හෝ වෙනත් ආත්මීය ව නිර්නිත ප්‍රයෝජනවත් කර්තව්‍යයක් සාක්ෂාත් කරගැනීම සඳහා සීරුමාරු කෙරෙන වාංමාලා සහිතව යොදාගනු ලැබූ හුදු ආත්මීය "ආඛ්‍යාන" හෝ "කතිකා" පමනි.

මේ ආස්ථානයේ සිට බලන විට "ඉතිහාසය" වෙතින් "පාඩම්" උපුටාගැනීමේ අදහස ම අවජාත ව්‍යාපෘතියක් වෙයි. ඇත්තෙන් ම අධ්‍යයනය කිරීමට කිසිවක් නැති අතර ඉගෙනගැනීමට ද දෙයක් නැත. ජෙන්කිංස් අවධාරනය කරන පරිදි, "පරම වසයෙන් ස්ව-විමර්ශී (කාව්‍යාලංකාරාත්මක) සංවාදවලින් ඔබ්බෙහි වූ කිසිදු වලංගු සත්භාවාත්මක හෝ ඥානවිභාගාත්මක හෝ ආචාරවිද්‍යාත්මක පදනමක් අපේ විශ්වාසයන් සඳහා නොපවතින සමාජ සැකැස්මවල් මධ්‍යයෙහි අප ජීවත් වන බව දැන් (අපට) සරල ව ම අවබෝධ කරගැනීමට සිදු ව තිබේ... එනයින්, කිසියම් අන්දමක සාරයක් ප්‍රකාශිත වූ අතීතයක් කියා දෙයක් කිසි කලෙක නොපැවති බවත් කිසි විටෙක පවතිනු ද නැති බවත් අපි අද හඳුනාගන්නෙමු."

තේරෙන භාෂාවකට පෙරලූ කල්හි ජෙන්කිංස් කියමින් සිටින්නේ මෙය යිඃ 1) අතීත හෝ වේවා වර්තමාන හෝ වේවා, මනුෂ්‍ය සමාජයන්ගේ ක්‍රියාකාරිත්වය, සොයාගත හැකි හෝ සොයාගතයුතු වන, වෛෂයික නියාමයන්ට අනුකූල ව අවබෝධ කරගත නොහැකි ය. සහ 2) මිනිසුන්, තමන් ජීවත් වන සමාජය පිලිබඳ සිතන, කියන හා කරන දෑ යටින් පවත්නා වෛෂයික පදනමක් නැත. ඉතිහාසඥයින් ය යි කියාගන්නා පුද්ගලයින්, අතීතය පිලිබඳ එක් හෝ තවත් අර්ථකථනයක් ඉදිරිපත් කල හැකි නමුදු - සමීපස්ථ විය හැකි වෛෂයික සත්‍යයක් නැති බැවින් - එක් අර්ථකථනයක් තවත් අර්ථකථනයක් මගින් විස්ථාපනය කරනු ලැබීම විසින් ඊට ප්‍රථමයෙන් රචිත දෙයට වඩා වෛෂයික ව සත්‍ය සම්පන්න වූ දෙයක් කරා වර්ධනය වීමක් ප්‍රකාශිත නොකෙරේ. එය හුදෙක්, ඉතිහාසඥයාගේ ආත්මීය ව ප්‍රත්‍යක්ෂ කර ගැනුනු ප්‍රයෝජනයන්ට ගැලපෙන හේතු නිසා අතීතය ගැන එක් අන්දමක කියමනක්, තවත් අන්දමක කියමනක් මගින් විස්ථාපනය කිරීම කි.

මේ දෘෂ්ටියෙහි යෝජකයෝ නූතනත්වයේ අභාවය අවධාරනය කරන මුත්, ඔවුන්ගේ නිගමන උපනයනය කර ගැනුනු ඓතිහාසික හා දේශපාලනික විනිශ්චයන්ගේ සමස්ත සංකීර්නය විභාග කර බැලීම, ප්‍රතික්ෂේප කරති. ඔවුන්ගේ න්‍යායික දෘෂ්ටීන්ට යටින් පවත්නා වූත්, එමගින් ප්‍රකාශනය සොයාගන්නා වූත්, දේශපාලන ආස්ථාන ඔවුහු සත්තකින් ම දරති. පශ්චාත් නූතනවාදයේ ප්‍රමුඛ ප්‍රකාශකයකු වන මහාචාර්ය හේඩ්න් වයිට් පැහැදිලිව ම මෙසේ කියා ඇතඃ " සමාජ ධූරාවලියේ 'ඉහලින්' හෝ 'පහලින්' දියත් කෙරුනේ වේවා, සමාජය හා ඉතිහාසය පිලිබඳ විද්‍යාව දරා සිටිම්හ යි කියාසිටින්නා වූ හෝ දේශපාලන 'ස්වයංසිද්ධතාව' වර්නනා කරන්නා වූ හෝ නායකයින් විසින් මෙහෙයවනු ලැබුනේ හෝ වේවා විප්ලවවලට මම දැන් විරුද්ධ වෙමි."

දෙන ලද දාර්ශනික සංකල්පයක වලංගුතාව එය ඉදිරිපත් කරන පුද්ගලයාගේ දේශපාලනය මගින් ස්වයංක්‍රීය ව නිෂ්ප්‍රභ වන්නේ නො වේ. එහෙත් පශ්චාත් නූතනවාදයේ ප්‍රතිමාක්ස්වාදී හා ප්‍රතිසමාජවාදී පථය කෙතරම් විශද ද යත්, එහි න්‍යායික සංකල්පයන් එහි දේශපාලන ඉදිරිදර්ශනයෙන් ලිහා වෙන් කිරීම සැබෑ වශයෙන් ම කල නොහැකි තරම් ය." (*රුසියානු විප්ලවය සහ විසි වන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු*, කම්කරුමාවත ප්‍රකාශන, පිටු 9-12)

ඔබ මෙම විශ්ලේෂනයට ප්‍රතිචාර දක්වමින් එයට පහර දීමට ඉදිරිපත් වන්නේ මෙසේ ය.

බුද්ධි ප්‍රබෝධයේ තාර්කික උරුමය ආරක්ෂා කරන ඕනෑ ම කෙනෙක් ප්‍රගතිශීලී ය; එයට එරෙහි වන ඕනෑ ම කෙනෙක් ප්‍රතිගාමී ය. මෙම කඨෝර ද්විබන්ධනය විසින්, මාක්ස්වාදයට තර්කබුද්ධිය පිලිබඳ සටනේ දී පෙරමුනු දෙකක; එක් අතකට අහේතු-අතර්කවාදය (ආගමික ගුඪවාදයේ ස්වරූපයෙන් හෝ නියට්ෂේ-හයිඩෙගර් පිලිවෙතේ හා එහි පශ්චාත් නූතනවාදී නිෂ්පන්නයන්ගේ ස්වරූපයෙන්) සහ අනෙක් අතට ඊට වඩා බොහෝ ප්‍රචලිතව පවත්නා, පන්ති ආධිපත්‍යයට යුක්තිප්‍රතිපාදනය කරන, ධනේශ්වර සමාජයේ

"තර්කබුද්ධිය'' (විශේෂයෙන් ම තත්කාර්යවාදය සහ අනුභූතිවාදය යන ස්වරූපයන්ගෙන්) ට එරෙහිව ද, සටන් කිරීමට සිදුව ඇතැ යි යන වැදගත් සත්‍යය වසන් කරයි. දෙවනු කී අර්ථයෙන් ගත් කල්හි මාක්ස්වාදය නියෝජනය කරන්නේ බුද්ධි ප්‍රබෝධයේ අපෝහක නිෂේධය යි. බුද්ධි ප්‍රබෝධයේ "තර්ක බුද්ධි" හැවය ඉරා දැමූ මාක්ස් නව රූපාකාරයක පන්ති පීඩනය සඳහා එය විසින් යුක්ති ප්‍රතිපාදනය කෙරෙන සැටි එළිදරව් කලේ ය.

මෙය මුලුමනින් ම ආකුලයකි. ප්‍රථමයෙන් ම ''ඕනෑ ම කෙනෙක්'' යන සර්වනාමය ඔබ විසින් යොදනු ලබන අයුරු ඔබ සඳහන් කරන ප්‍රවනතාවයන් අනන්‍ය කර ගැනීමෙන් පාඨකයා වලකාලීමට සෑහේ. ඔබ විරුද්ධත්වය දක්වන ඡේදයේ දී මම, මානව ප්‍රගතියේ ශක්‍යතාවය පිලිබඳ විශ්වාසය මත පදනම් වූ - මෙය මෙය (18 වන සියවසේ) බුද්ධි ප්‍රබෝධයේ පටන් 20 වන ශතවර්ෂයේ වැඩි කාලයක් පුරා ම දිවෙයි - 'නූතනවාදී' ව්‍යාපෘතිය අසාර්ථක වී යයි අභ්‍යර්ථනය කරන පශ්චාත් නූතනවාදයේ විශ්වාසයට පහරදුනිමි. මගේ දේශනයේ මෙම ඡේදයට ඔබ දක්වා තිබෙන ප්‍රතිචාරයෙන් පෙනී යන්නේ මගේ විවේචනයට ලක් වූ පශ්චාත්-නූතනවාදයේ එම සංකල්පයන් සමග ඔබ අනන්‍ය වී ගන්නා බව ය. එහෙත් තර්ක-බුද්ධි උරුමයේ හා මානව ප්‍රගතියේ ශක්‍යතාවයේ ආරක්ෂකයන් අතුරෙන් ඔබ ප්‍රතිගාමී යයි සලකන්නේ කවරෙක් දැයි ප්‍රකාශ කිරීමට ඔබ අසමර්ථ වන්නෙහි ය. මා මෙසේ අසන්න ද? මහා මාක්ස්වාදීන්ගේ කෘතිවලින් කුමන එකෙහි ද බුද්ධි ප්‍රබෝධයේ චින්තකයන් හෙලා දැකීම හෝ ඔවුන්ගේ විරුද්ධවාදීන් වර්නනා කිරීමක් දක්නට ලැබෙන්නේ?

බුද්ධි ප්‍රබෝධයේ චින්තකයන්ගේ තර්ක-බුද්ධිය හුදෙක් පන්ති පීඩනය සඳහා යුක්ති ප්‍රතිපාදනයක් කලා පමනකැයි කඨෝර ලෙස යෝජනා කිරීම මගින්, ඔබේ ඡේදය කරන්නේ 18 වන ශතවර්ෂයේ යෝධ ධනේශ්වර විප්ලවයන්ට ද මෙම මහා විප්ලවයන්ගෙන් කල් යාමේ

දී ඉස්මතු වූ ධනේශ්වර ධනපති සමාජයන්ගේ සමාජ-ආර්ථික යථාර්ථයට ද බුද්ධිමය අත්තිවාරම දැමූ යෝධ න්‍යායික අරගලයන් - තනි එක් නො බෙදුනු හා අනයිතිහාසික සන්තතියක් බවට ගුලි කර දැමීමයි. කෙසේ වෙතත්, බුද්ධි ප්‍රබෝධයේ චින්තකයන් ඓතිහාසික කොන්දේසි තුල සැකැසුනු කුමන මිත්‍යා විශ්වාස - වඩාත් නිශ්චිතව කීවොත් "තුන්වන ස්තර" යේ විමුක්තිය සකල මානව වර්ගයාගේ විමුක්තිය ය යන අදහස - දරා සිටියත් ඔවුන්ගේ න්‍යායික වැඩ කටයුතු අවසානයේ දී ධනේශ්වර සමාජය මත සමාජවාදී ප්‍රහාරයට බුද්ධිමය හා සදාචාරාත්මක (සමහර සීමාවන් තුල වුව ද) පදනම් සම්පාදනය කලේ ය. 17 වන හා 18 වන ශතවර්ෂවල විප්ලවවාදී චින්තකයෝ, නව සමාජවාදී ව්‍යාපාරය සහ පැනනගිමින් පැවැති කම්කරු පන්තිය 19 වන ශතවර්ෂයේ දී ධනේශ්වර සමාජයට එරෙහිව අන්තිමේ දී යොදා ගනු ලැබුවා වූ අවිආයුධ සකසා පන්නරය දැමූහ. ධනේශ්වර සමාජය පිලිබඳ විචාරය සඳහා න්‍යායික ආවේගයෙන් එතරම් ප්‍රමානයක් සම්පාදනය කරන ලද්දේ ධනේශ්වරය විසින් ප්‍රන්ස විප්ලවයෙන් ඉක්බිත්තේ තර්ක-බුද්ධියේ පරමාර්ථයන් පාවාදීම ය. එපමනක් නො ව බුද්ධි ප්‍රබෝධයේ චින්තකයන් ''නව ආකාර පන්ති පීඩනයක් සඳහා යුක්ති ප්‍රතිපාදනයන් නිර්මානය කලෝය'' යන ඔබගේ අභ්‍යර්ථනය භයංකර විරූපී ඒක පාක්ෂිකත්වයෙන් යුතු ය. මූලික වසයෙන් ම අසත්‍ය ය.

ඔබ බුද්ධි ප්‍රබෝධයේ චින්තකයන්ගේ ගම්‍ය වසයෙන් කොමියුනිස්ට්වාදී වූ න්‍යායයන් සරලව ම නො තකා හරින්නෙහි ය; බුද්ධි ප්‍රබෝධයේ භෞතිකවාදී දර්ශනවාදය එහි අඩුපාඩුකම් තිබුනේ වී නමුත් දේපල සහ අසමානතාව ප්‍රතික්ෂේප කිරීම දිශාවට යොමු වූ බව නො දන්නා බවක් ප්‍රදර්ශනය කරන්නෙහි ය. මාක්ස් සිය හෝලි ෆැමිලි කෘතියේ දී 18 වන ශතවර්ෂයේ ප්‍රන්ස භෞතිකවාදය පිලිබඳව පෙන්නුම් කල පරිදි:

> "මිනිසුන්ගේ ප්‍රාරම්භක යහපත් බව, සහ සමාන ශක්ති සහගත බව ද අත්දැකීමේ, පුරුද්දේ සහ අධ්‍යාපනයේ සර්ව බලධාරිත්වය ද, බාහිර පරිසරය මිනිසා මත දරන්නා වූ බලපෑම ද කර්මාන්තමය ක්‍රියාකාරිත්වයේ ඉමහත් අර්ථභාරය ද, විනෝදවීම යුක්තියුක්ත කිරීම ද යනාදී මේ සියල්ල පිලිබඳ භෞතිකවාදයේ උගැන්වීම්, කොමියුනිස්ට්වාදය සහ සමාජවාදය සමග කෙතරම් සම්බන්ධව ඇත් ද යන්න දැක ගැනීමට යෝධ තීක්ෂන භාවයක් උවමනා කරන්නේ නැත." [*Marx Engels Collected Works*, volum 4 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 4 වන වෙලුම, නිව් යෝර්ක්, 1975; 130 පිටුව)].

ධනේශ්වර සමාජයේ "තර්ක බුද්ධියට" එරෙහිව සටන් වැදිය යුතු යයි ඔබ මාක්ස්වාදීන්ට කරන කැඳවුම ව්‍යාකූල ය, නො මග යවන සුලු ය. ධනේශ්වර සමාජයේ ඓතිහාසික වර්ධනයේ ගමන් මගේ දී පන්ති ප්‍රතිසතිතාවන්ගේ වර්ධනයේ දී ධනේශ්වර පන්තිය එන්න එන්නම වැඩිවැඩියෙන් ආත්මීයවාදී වූ ද, තර්ක බුද්ධි විරෝධී වූ ද, දර්ශනවාදයන් වැලඳ ගනිමින් ''තර්ක බුද්ධිය'' අත හැර දැමීමට වඩවඩාත් නැඹුරු විය. 1848-49 අසාර්ථක වූ විප්ලවයන්ගෙන් පසු හෙගල්ගේ ආරෝහය පිරිහී යාම ද, ඉන් ඉක්බිති හෙගල් වෙනුවට දර්ශනවාදයේ මහා පුරුෂයන් ලෙස ෂෝපන්හෝවර් සහ පසුව නියේෂ් යොදා ගැනීම ද ධනේශ්වරය විසින් තර්ක බුද්ධිය අතහැර දැමීමේ ප්‍රකාශනයන් ය. 'තර්ක-බුද්ධිය' යන්නෙන් ස්වභාව ධර්මයේ ද සමාජයේ ද නීති නියාමයන්ට විද්‍යාත්මක අභිනිවේෂයක් ලබා ගනිමින් සූරාකෑම, පීඩනය සහ අයුක්තිය අවසාන කර දැමීමට මිනිසාට ඇති ධාරිතාව වටහා ගත් ශ්‍රේෂ්ඨ මාක්ස්වාදීහු ම තමන් බුද්ධි ප්‍රබෝධයේ තර්ක-බුද්ධිය පිලිබඳ විප්ලවවාදී උරුමය නියෝජනය කරන බව සෑම විටමත් අභ්‍යර්ථනය කර ඇත්තාහ. මොස්කව් නඩු විභාගයේ චෝදනා පිලිබඳව, ඇමරිකානු දාර්ශනික ජෝන් ඩිවි සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවේ ඉදිරියේ තම මහා දේශනය සමාප්ත කිරීමේ දී ට්‍රොට්ස්කි ආවහනය කලේ මෙම උරුමය යි.

> "ගෞරවාර්හ කොමිෂන් සභිකයෙනි! සාර්ථකත්වයන් මෙන් ම අසාර්ථකත්වයන් ගෙන් අඩුවක් නො වූ මගේ ජීවිතයේ අත්දැකීම, මානව වර්ගයාගේ පිරිසිදු දීප්තිමත් අනාගතය පිලිබඳව මගේ විශ්වාසය විනාශ කර නැතුවාක් පමනක් නො ව, එයට ප්‍රතිකූලව, එම විශ්වාසයට අවිනාශනීය (නො නැසිය හැකි) පන්නරයක් ලබා දී ඇත. මවිසින් අටලොස් වියේ දී නිකොලයෙව් නමැති රුසියානු ප්‍රත්‍යන්ත නගරයේ කම්කරු නිවහන්වලට ගෙන යන ලද, තර්ක බුද්ධිය ද සත්‍යය ද, මානව සහයෝගය ද පිලිබඳ මෙම විශ්වාසය - මුලුමනින් හා පරිපූර්නව මා රැක - දරා සිට ඇත. [*The Case of Leon Trotsky*, (ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ නඩුව) නිව් යෝර්ක්-1969; 584-85 පිටු.]

බුද්ධි ප්‍රබෝධයට එරෙහිව ඔබ කරන මාරක පහරදීම්වල දී ඔබ නියෝජනය කරන සම්ප්‍රදායේ මූලාරම්භයන් දුටන්නේ මාක්ස් කරා නො වේ, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ දිරිසුන් සුලු-ධනේශ්වර න්‍යායඥයන් - විශේෂයෙන් ම, මූලාරම්භයේ දී මැක්ස් හෝර්ක්හයිමර් සහ තියඩෝර් ඇඩෝර්නෝ තමන්ගේ (බුද්ධි ප්‍රබෝධයේ අපෝහකය) *Dialectic of Enlightenment* නම් කෘතියේ වර්ධනය කල සංකල්පයන් කරා ය. මෙම කෘතියේ දී, 20 වන ශතවර්ෂයේ මහා ව්‍යසනයන්ට හේතුව ලෙස දක්වන ලද්දේ 18 වන ශතවර්ෂයේ බුද්ධි ප්‍රබෝධය යි. ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනයට ප්‍රතිපාදනය කල සාධක ලෙස මානව තර්ක-බුද්ධිය, තාක්ෂනය, විද්‍යාව පමනක් නො ව සමාජ ප්‍රගතියම ද දක්වනු ලැබ ඇත. බුද්ධි ප්‍රබෝධයේ අපෝහකය නම් කෘතියේ කේන්ද්‍රීය තර්ක පසු ගිය ගිම්හානයේ ඈන් ආබර්හි දී පීටර් ෂ්වාර්ට්ස් සහෝදරයා විසින් කරන ලද දේශනයේ දී සංක්ෂිප්තව ඉදිරිපත් කරන ලදී. ඔබේ ලියවිල්ල ඔහුගේ විශ්ලේෂනය

පිලිබඳ කිසිදු සඳහනක් නො කරයි. ඔබ විසින් කරනු ලබන ''අපෝහක නිෂේධනය'' හා ''අපෝහක බිඳීම'' වැනි පද දමා ගැසීම ඔබ බුද්ධි ප්‍රබෝධයට එල්ල කරන පහර දීමට තර්කානුකූල බවක් හෝ ගාම්භීර බවක් අත් කර දෙනු නැත. ඒ වෙනුවට ඉන් පෙන්නුම් කෙරෙන්නේ මාක්ස්වාදයට සතුරු වූ සංකල්පයන්ගේ සේවාව සඳහා ව්‍යාජ-හේගලියානු වාංමාලාවක් පාවිච්චි කිරීමට ඔබ උත්සාහ කරන සැටියයි.

## මතු සම්බන්ධයි

## සටහන්

11. විප්ලවවාදී මාක්ස්වාදීන් එතරම් විශාල සංඛ්‍යාවක කාර්යය වූ පුවත් කලා වේදය අපහාස වචනයක් බවට පත් වූයේ කවදාදැයි ඇසීමට අපට අයිතියක් තිබේ. මාක්ස් උපයාගත් සුළු මුදල ඔහු උපයා ගත්තේ ප්‍රවෘත්ති ලේඛකයෙකු ලෙස ඔහු කල වැඩ කටයුතුවලිනි. 1917ට පෙර ට්‍රොට්ස්කි තමාගේ

ඊකියාව "පුවත් කලා වේදය"යි සඳහන් කලේ ය. ගිනිය නොහෙන තරම් මාක්ස්වාදීහු මේ වෘත්තියේ නිරත වූ හ. (ඔස්කා) වයිල්ඩ් අනුව යමින් පැවසිය හැක්කේ පුවත්පත් කලා වේදයෙහි නිරත වීම ශීලාචාර හෝ අශීලාචාර නොවන බවයි. ප්‍රශ්නය නම් කවුරුන් හෝ පුවත් කලා වේදයේ හොඳට යෙදෙනවාද? නරකට යෙදෙනවාද? යන්න යි. අවංක නිරීක්ෂකයෙක් සහ විශ්ලේෂකයෙක් ද නැතිනම් පාලක ප්‍රභූවේ ප්‍රචාරකයෙක් හෝ ක්ෂමාලාපකයෙක් ද යන්නයි.

12. නැන්සි ෆීල්ඩ්ස්ගේ විකාශනය මීට අවුරුදු 30කට වඩා පෙර බ්‍රෙනර් සහෝදරය, ඔබත් මමත් එක්ව කල *The Fourth International and the Renegade Wohlforth* (හතර වන ජාත්‍යන්තරය සහ වුල්ෆර්ත් භ්‍රෂ්ටයා) නමැති පොත් පිංච තුල අප දෙදෙනා එකතුව කල තක්සේරුව මුලුමනින්ම සනාථ කරයි. මෙම කෘතිය යලිත් කියවන ලෙස ඔබ දැඩිව උනන්දු කිරීමට මම කැමැත්තෙමි.

© www.wsws.org